# ඕසෝන් ඡායාරූප සහ චිත්‍ර තරඟාවලිය 2023

තරඟයට ඉදිරිපත් වීමට අදාළ කොන්දේසි

1. **අදහස්**

- කිගාලි සම්මුතිය ඇතුළු මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීමෙන් ඕසෝන් ස්තරයට සහ දේශගුණික ආරක්ෂාවට ප්‍රතිලාභ
  උදා: හොඳ සේවා භාවිතයන්, මොන්ට්‍රියල් සන්ධානය යටතේ පාලිත ද්‍රව්‍ය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඕසෝන් සහ දේශගුණයට හිතකර විකල්ප අනුගමනය කිරීම ආදිය.
- ඕසෝන් ස්තරයේ ආරක්ෂාව සඳහා සහය වීමට මහජනතාවට ගත හැකි ක්‍රියාමාර්ග/මූලාරම්භයන්.
- ඕසෝන් ස්තරය ක්ෂය වීමේ බලපෑම්/ප්‍රතිවිපාක.
- මොන්ට්‍රියල් සන්ධානය යටතේ විශේෂයෙන් කිගාලි සම්මුතිය දේශගුණික විපර්යාස සමඟින් එක්ව ගත් කල, ඕසෝන් ස්තරය සහ දේශගුණ ආරක්ෂණ ක්‍රියාකාරකම් අතර සම්බන්ධය.
- මොන්ට්‍රියල් සන්ධානය ක්‍රියාත්මක කිරීමේ සන්දර්භය තුළ ඕසෝන් ස්තරය සහ දේශගුණික ආරක්ෂාව සඳහා කාන්තාවගේ භූමිකාව සහ දායකත්වය.
- ඕසෝන් ස්තරයට සහ දේශගුණික ආරක්ෂණ වෙනුවෙන් වඩාත් හොඳින් සේවය කිරීම සඳහා ශීතකරණ සහ වායු සමීකරණ උපකරණ ස්ථාපනය කිරීම, සේවා කිරීම, නඩත්තු කිරීම සහ බැහැර කිරීමේ යහපත් පුරුදු.
- මොන්ට්‍රියල් සන්ධාන විධිවිධානය ක්‍රියාත්මක කිරීමට අදාළ ජයග්‍රහණ.
- තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායක වන මොන්ට්‍රියල් සන්ධානය යටතේ ගනු ලබන ක්‍රියාමාර්ගවල බලපෑම

1.1. චිත්‍ර තරඟයේ තේමාව

*'ඕසෝන් ස්තරය ආරක්ෂාකර මිහිමත ජීවය සුරකිමු' හෝ ලෝක ඕසෝන් දින තේමාව*

2. **වැඩිදුර තොරතුරු සඳහා සබැඳි**

https://ozone.unep.org/ozone-and-you

https://www.youtube.com/@nationalozoneunit-srilanka4486/playlists

## 3. සුදුසුකම්

පහත වයස් කාණ්ඩවලට අයත් ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකු සහභාගී වීමට සුදුසුකම් ලබයි. පාසල් මට්ටමේ කාණ්ඩය යටතේ සහභාගිවන්නන් සඳහා දෙමාපියන්ගේ/පාසලේ කැමැත්ත අවශ්‍ය වේ.

<u>වයස් මට්ටම</u>

- පාසල් කාණ්ඩය: මෙම කාණ්ඩයට අදාළව නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා දෙමාපියන්ගේ සහ පාසලේ කැමැත්ත අවශ්‍ය වේ.
  - කනිෂ්ඨ අංශය - 2023 සැප්තැම්බර් 16 වන විට වයස අවුරුදු 13 හෝ ඊට අඩු (ලෝක ඕසෝන් දිනය)
  - ජ්‍යෙෂ්ඨ අංශය - 2023 සැප්තැම්බර් 16 දිනට වයස අවුරුදු 13 ට වැඩි (ලෝක ඕසෝන් දිනය)

- සාමාන්‍ය කාණ්ඩය : තනි පුද්ගලයින් වශයෙන් සහභාගී විය හැකි අතර, 2023 සැප්තැම්බර් 16 දිනට වයස අවුරුදු 19 ට වැඩි (ජගත් ඕසෝන් දිනය)

• සංවිධායක කමිටුව, විනිශ්චයකරුවන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සහභාගී වීමට සුදුසුකම් නොලබයි. තරඟයට සහභාගී වීමට කාන්තා අයදුම්කරුවන් විශේෂයෙන් උනන්දු කරනු ලැබේ.

## 4. නිර්මාණ ඉදිරිපත්කල හැකි ආකාරය

ඡායාරූප : අධික ඩිජිටල් හැසිරවීමකින් තොරව කැමරාවකින් ලබාගත් මුල් ඡායාරූප ඇතුළුව (අමතර වස්තු එකතු කිරීම හෝ මුල් ඡායාරූපයෙන් යම් වස්තුවක් ඉවත් කිරීම වැනි). ආලෝකය, දීප්තිය, පරස්පරතාව වැනි සුළු ඡායාරූප ගැලපීම් භාවිතා කළ හැකිය.

චිත්‍ර : සාම්ප්‍රදායික හස්ත සිතුවම්/චිත්‍ර හෝ අතින් නිර්මාණය කරන ලද තල දෙකේ (two-dimensional) වෙනත් කලා හෝ ඩිජිටල් නිර්මාණ පිළිගනු ලැබේ.

## 5. නිර්මාණ ඉදිරිපත් කිරීම

- ඉදිරිපත් කරනු ලබන නිර්මාණයේ ඩිජිටල් රූප ගොනුවක් JPEG/PNG file format(s) මඟින් අදාළ google පෝරමය සම්පූර්ණ කර (අදාළ පෝස්ටරයේ ඇති QR කේතය මඟින්) ලිපිනයට 2023 ජූනි 30 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.
  https://forms.gle/JE3z9bJSVFrRemwu8

- මුල් නිර්මාණය (චිත්‍ර පමණක්), **අධ්‍යක්ෂ (වායුසම්පත් කලමනාකරණ හා ජාතික ඕසෝන් ඒකකය)**, **අංක.416/C/1, පරිසර අමාත්‍යාංශය**, **'සොබාදම් පියස'**, **රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල** යන ලිපිනයට 2023 ජූනි 30 දින හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.
- අදාළ ඡායාරූප ගොනුව අවම වශයෙන් 2,000 pixels මානයකින් යුක්ත විය යුතු අතර ගොනුව මෙගාබයිට් 10කට (10MB) වඩා වැඩි නොවිය යුතුය.
- කලා කෘති කිහිපයක් ඇතුළත් කලද, සහභාගිවන්නෙකු එක් සම්මානයකට පමණක් සුදුසුකම් ලබයි. එක් සහභාගිවන්නෙකුට උපරිම නිර්මාණ 5 ක් දක්වා ඉදිරිපත් කිරීමට අවසර ඇත.

- චිත්‍ර අංශය : A3 Paper size (297×420 mm)
  ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කල හැකිය

- සෑම නිර්මාණයක්ම පහත තොරතුරු සමඟ ඉදිරිපත් කළ යුතුය:
  - මාතෘකාව
  - නිර්මාණයපැහැදිලි කරන ශීර්ෂ පාඨය (ඉංග්‍රීසි හෝ ජාතික භාෂාවෙන් උපරිම වචන 60ක් වන ලෙස)
  - අයදුම්කරුගේ නම
  - පාසලේ නම, දුරකතන අංකය සහ ලිපිනය (පාසල් අයදුම්කරුවන් සඳහා)
  - වයස් කාණ්ඩය සහ 2023 සැප්තැම්බර් 16 වන විට වයස
  - ස්ථිර ලිපිනය (විවෘත කාණ්ඩය)
  - දුරකතන අංකය
  - විද්‍යුත් තැපැල් ලිපිනය (ඇත්නම්)

වාණිජ වෙළඳ ලකුණු සහ/හෝ සමාගම් නාම ආදියෙහි රූප සහිත ඕනෑම නිර්මාණයක් තරඟය සඳහා නුසුදුසු වනු ඇත.

## 6. ඇගයීම

6.1. ඡායාරූප කාණ්ඩය - සියලුම වයස් කාණ්ඩ සඳහා විවෘතයි

6.2. චිත්‍ර කාණ්ඩය

- **පාසල් කාණ්ඩය**
  - කනිෂ්ඨ අංශය - 2023 සැප්තැම්බර් 16 වන විට වයස අවුරුදු 13 හෝ ඊට අඩු (ලෝක ඕසෝන් දිනය)
  - ජ්‍යෙෂ්ඨ අංශය - 2023 සැප්තැම්බර් 16 දිනට වයස අවුරුදු 13 ට වැඩි (ලෝක ඕ ඕසෝන් දිනය)

- **සාමාන්‍ය කාණ්ඩය**
  තනි පුද්ගලයින් වශයෙන් සහභාගී විය හැකි අතර, 2023 සැප්තැම්බර් 16 දිනට වයස අවුරුදු 19 ට වැඩි (ජගත් ඕසෝන් දිනය)

## ඇගයීම් නිර්ණායක

1. තේමාවට අදාළත්වය - 25%
2. දෘශ්‍ය කාර්යක්ෂමතාව - 25%
    i. භාවිතා කරන ලද මූලද්‍රව්‍ය
    ii. සන්නිවේදන අංග
    iii. අංගයන්හි උචිතබව
3. තාක්ෂණික කුසලතා - 25%
    i. සමතුලිත බව - අක්ෂර/සංඛ්‍යා
    ii. කලාත්මක බව
    iii. නිමාව
4. මුල්පිටපතක් වීම සහ නිර්මාණාත්මක බව - 25%

## 7. ත්‍යාග

ජයග්‍රාහකයින් වෙනුවෙන් වටිනා ත්‍යාග තුනක් (පලමු, දෙවන සහ තෙවන ස්ථාන සඳහා) සහ සැනසිලි ත්‍යාග පහක් ප්‍රදානය කෙරේ. එම ත්‍යාග පිළිබඳ විස්තර මෙසේය.

| | **ඡායාරූප** | **චිත්‍ර** (කනිෂ්ඨ) | **චිත්‍ර(ජ්‍යෙෂ්ඨ / සාමාන්‍ය)** |
|---|---|---|---|
| පළමු | Rs.30,000.00 | Rs.25,000.00 | Rs.30,000.00 |
| දෙවන | Rs.25,000.00 | Rs.20,000.00 | Rs.25,000.00 |
| තෙවන | Rs.20,000.00 | Rs.15,000.00 | Rs.20,000.00 |
| සැනසිලි ත්‍යාග | Rs.10,000.00 | Rs.10,000.00 | Rs.10,000.00 |

2023 ලෝක ඕසෝන් දින සැමරුමේදී ජයග්‍රාහකයින්ට ත්‍යාග ප්‍රදානය සිදු කෙරේ.

## 8. ප්‍රකාශන අයිතිය සහ නීතිමය කරුණු

තරඟයට ඉදිරිපත්වන්නන් තමා ඉදිරිපත් කරන කලා නිර්මාණවල පරම කර්තෘ විය යුතු අතර, එකී නිර්මාණවල සියලුම බුද්ධිමය දේපල අයිතීන් දැරිය යුතුය. මෙම කලා නිර්මාණ මුල් නිර්මාණ විය යුතු අතර, ජීවත්වන රට නොසලකමින්, යම් තෙවන පාර්ශ්වයක බුද්ධිමය දේපල හෝ වෙනත් අයිතීන් උල්ලංඝනය නොකළ යුතු සේම, පෙර තරඟවලදී ජයග්‍රහණය නොකර ඇති සේම, වෙනත් යම් මාධ්‍යයක (මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයක) ප්‍රකාශයට පත් කර නොමැති සහ මෙම තරඟය අතරවාරයේදී වෙනත් යම් තරඟයකට නිර්මාණයක් ලෙස ඉදිරිපත් කර නොතිබිය යුතුය. මොනයම් අවස්ථාවකදී හෝ අන් අයගේ නිර්මාණ තමාගේ සේ ඉදිරිපත් කිරීමට අවසර නොලැබේ. ඉදිරිපත් කිරීමට පෙර ප්‍රකාශන අයිතියේ සියලුම පැතිකඩ නිරාකරණය කිරීම තරඟයට ඉදිරිපත්වන්නාගේ වගකීම වේ. තෙවන පාර්ශ්වයකගේ ප්‍රකාශන හෝ වෙනත් යම් බුද්ධිමය දේපල අයිතියක් උල්ලංඝනය කෙරෙන යම් නිර්මාණ ඉදිරිපත් කිරීමක් තරඟයෙන් ඉවත් කිරීමට පරිසර අමාත්‍යාංශයට අයිතිය ඇති අතර, යම් ප්‍රකාශන අයිතියක් උල්ලංඝනය කිරීමක් හෝ බලය නොලත් නිර්මාණ ඉදිරිපත් කිරීමක් සඳහා වග නොකියන්නා සේම, ඊට කවරාකාරයෙන් හෝ වග නොවේ.

තරඟයට සහභාගිවන්නන්, සකස් කර, ඉදිරිපත් කරන ලද කලා නිර්මාණයේ ප්‍රකාශන අයිතියක්, ආශ්‍රිත අයිතියක් හෝ නෛතික වශයෙන් හටගෙන ඇති හෝ ඇති විය හැකි වෙනත් බුද්ධිමය දේපල අයිතීන් කිසිදු පිරිවැයකින්/වගකීමකින්/සීමාකිරීමකින් තොරව භාවිත කිරීම සඳහා අනන්‍ය නොවූ, අවලංගු කළ නොහැකි, මාරු කළ හැකි, ස්ථිර හා ලෝකයටම වලංගු වන ආකාරයේ බලපත්‍රයක් ජාතික ඕසෝන් ඒකකය සහ පරිසර අමාත්‍යාංශය මගින් බලය ලබා දී

ඇති වෙනත් පුද්ගලයින් හෝ ආයතනය වෙත ප්‍රදානය කරයි. අනෙක් අතට, එකී කලා නිර්මාණ ජාතික ඕසෝන් ඒකකය මගින් භාවිත කිරීමේදී, එම නිර්මාණවල කර්තෘ/නිර්මාණකරු සඳහන් කර, නිසි ලෙස ඔහුට/ඇයට ලබා දිය යුතු ගරුත්වය ලබාදීමට ජාතික ඕසෝන් ඒකකය බැඳී සිටියි. තරඟය අතරතුරදී සහ අවසන් වීමෙන් පසුව, සමස්තයක් ලෙස හෝ අර්ධ වශයෙන්, මුල් නිර්මාණවල සංස්කරණය කරන ලද පිටපත් ද ඇතුලුව සියලුම නිර්මාණ ජාතික ඕසෝන් ඒකකයේ වෙබ් අඩවියේ/ප්‍රකාශනයේ හෝ වෙනත් අදාල වෙබ් අඩවිවල/ප්‍රකාශනවල ප්‍රචාරණය කිරීමට ජාතික ඕසෝන් ඒකකය හට අයිතිය ඇත.

නිදසුනක් ලෙස යම් පුද්ගලයෙකුගේ ඡායාරූපයක් වැනි මානවයින්ට අදාල කලා නිර්මාණ සම්බන්ධයෙන්, තරඟයට ඉදිරිපත් කරන කලා නිර්මාණවල අන්තර්ගත පුද්ගලයින්ගේ අවසරය සහ එකඟතාව ලබාගෙන තිබිය යුතු අතර, ජාතික ඕසෝන් ඒකකය විසින් එම කලා නිර්මාණ භාවිත කිරීම හෝ ප්‍රචාරණය කිරීම සිදු කළ හැකිය. කෲර, නෛතික නොවන, විශේෂ කොට සලකන, ලිංගික අන්තර්ගතයන් ඇතුලත් හෝ අපහාසාත්මක කරුණු හෝ එම කලා නිර්මාණය සිදු කර, සංස්කරණය කරන ලද රටට අදාල යම් නීතියක් උල්ලංඝනය කරන කරුණක් මෙම කලා නිර්මාණවල අන්තර්ගත නොවිය යුතු අතර, එසේ නොමැති නම්, පිළිගැනීමට ලක් කළ නොහැකි වේ. මෙම නිර්මාණ තුළ යම් තෙවන පාර්ශ්වයකගේ වෙළඳ ප්‍රචාරණයක්, සටන් පාඨයක්, සලකුණක් හෝ වෙළඳ නාමයක් හෝ අන්තර්ගත නොවිය යුතු අතර, වෙනත් ආකාරයකින් යම් තෙවන පාර්ශ්වයකගේ හෝ වාණිජමය ආයතනයක අනුග්‍රාහකත්වය හෝ නිර්දේශ කිරීමක් සඳහන් නොකළ යුතුය.

තරඟයේ පැතිකඩවල් හෝ තරඟයම වෙනස් කළහොත් හෝ අවලංගුකළහොත් හෝ ජාතික ඕසෝන් ඒකකය ඊට වග කියනු නොලැබේ. තරඟයට සහභාගිවන තරඟකරුවෙකු හට යම් ත්‍යාගයක් පිළිගැනීමේ හෝ පිළිනොගැනීමේ හේතුවෙන් සිදු වන හානියක්, පාඩුවක්, අනර්ථයක් හෝ කළකිරීමක් සම්බන්ධයෙන් ජාතික ඕසෝන් ඒකකය කිසිදු වගකීමක් දරනු නොලැබේ.

ජාතික ඕසෝන් ඒකකයෙහි පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිදු කාර්යයක් වෙනුවෙන් ජාතික ඕසෝන් ඒකකයෙහි නම සහ/හෝ සලකුණ/ලාංඡනය භාවිත කිරීමට හෝ තෙවන පාර්ශ්වයකට භාවිත කිරීමට ඉඩ ලබාදීමට තරඟයට සහභාගිවන කිසිදු තරඟකරුවෙකු හට බලය ලබා නොදේ.

තාක්ෂණික බාධාවක් හෝ වරදක්, ජාලවල තදබදය හෝ වෙනත් යම් කරුණක් හේතුවෙන් ප්‍රමාද වන, සාවද්‍ය හෝ හඳුනාගත නොහැකි යම් පිළිතුරක්, ප්‍රවේශයක් හෝ ඉදිරිපත් කිරීමක් සඳහා සංවිධායකයා වග නොකියනු ලැබේ. යම් පිළිතුරක්, ප්‍රවේශයක් හෝ ඉදිරිපත් කිරීමක් පිළිබඳ ආරාවුලකදී, සංවිධායකයාගේ තීරණය අවසානාත්මක වේ.

මෙම සම්මානය හුවමාරු කළ නොහැකි, ආපසු අයකරගත නොහැකි, පවරා දිය නොහැකි මෙන්ම මුදල් හෝ මුදල් හා සමාන ද්‍රව්‍යයකට හෝ එවැනි ආකාරයේ වෙනත් යම් ප්‍රතිලාභයක් සඳහා හුවමාරු කළ නොහැකිය.